# දායකයන් කැලණි විහාරය කැඩීම සැමරීම

සති අන්ත පත්තර කඩමාළුවලට ලියන ඊනියා ප්‍රබුද්ධයන්ගේ සිට විශ්‍රාමලත්, හිටපු මාක්ස්වාදීන් හරහා විවිධාකාරයේ උගතුන් ලෙස සමාජය විසින් සම්මත කෙරී ඇති වාමාංශික මෙන්ම දක්ෂිණාංශිකද, පුද්ගලයන් අතර ඉතා ජනප්‍රිය මාතෘකාවක් වී ඇත්තෙ සිංහල බුද්ධාගම, හෙවත් ඔවුන් බොහෝ දෙනා හඳුන්වන ආකාරයෙන් ථෙරවාදයේ මෙරට ආධිපත්‍යය වෙයි. මේ සියල්ලෝම අවස්ථාව ලත් විගස ථෙරවාදයට උඩ පැන පැන තළති. අපේ රටේ සියලු ප්‍රශ්නවලට ප්‍රධාන හේතුව මේ ථෙරවාදී ආධිපත්‍ය යැයි ඔවුහු කියති. ඒ අතර ඔවුන් කියනා දූර්වලකම්වලට ද හේතුව ථෙරවාදය ම බැව් ඔවුහු කිසිම සැකයකින් තොරව පවසති. උදාහරණයක් ලෙස ගතහොත් මෙරට සංගීතයක් බිහිවී නැති බවත් එයට හේතුව ථෙරවාදය බවත් යම්තම් දැන් සිංහල සංගීතයක් ඇත්තේ කතෝලික ආගම නිසා බවත් මේ පණ්ඩිතයෝ කියති. මෙරට අද පැතිරී යන අපරාධ රැල්ලට ද හේතුව ථෙරවාදය බව පැවසෙයි. අඩුම තරමින් ඒ අපරාධ රැල්ල පිළිබඳ ථෙරවාදයට සමච්චල් කෙරෙයි.

එක්තරා යුගයක මෙරට සිංහල ථෙරවාද බුද්ධාගමේ ආධිපත්‍යයක් තිබී ඇති බව පැහැදිළිය. එහෙත් අද නම් මෙරට ඇත්තේ බටහිර ක්‍රිස්තියානි ආධිපත්‍යයකි. මේ තත්ත්වය පසුගිය අවුරුදු පන්සීයයකට පමණ කාලය තුළ පෘතුගීසි, ලන්දේසි, බ්‍රිතානි ආණ්ඩු හා වත්මන් ඇමරිකන් ආණ්ඩුව යටතේ වර්ධනය වී ඇත. අද ථෙරවාදයේ ආධිපත්‍යයක් ගැන කතා කරන්නේ දූර්වල කර ඇති ථෙරවාදි සසුන නැති කර දැමීමේ අරමුණින්ය. එසේ කරන්නේ බටහිර ක්‍රිස්තියානි ආධිපත්‍යය තව තවත් වැඩි කිරීමටය. අනුරාධපුර සමයේ එක්තරා වකවානුවක මෙරට තිබු සිංහල ථෙරවාදි ආධිපත්‍ය අදත් මෙරට ඇතැයි කීම බටහිර ක්‍රිස්තියානි ආධිපත්‍යය රට පුරා ප්‍රචලිත කිරීම පහසු කර ගැනීම සඳහා පතුරුවන කෙප්පයක් පමණකි. අද මෙරට පවතින අරාජික තත්ත්වයටත් අපරාධ රැල්ලටත් වගකිව යුතු වන්නේ ශීඝ්‍රයෙන් පැතිරී යන බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආකල්ප හා ආධිපත්‍යය බව අපට කරුණු සහිතව පෙන්වා දිය හැකිය. එය නොපිළිගන්නා අයෙක් වෙනත් නම් කළ යුතු වන්නේ කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ හෝ වෙන් තැනක හෝ විවාදයක, සාකච්ඡාවක්, සම්මන්ත්‍රණයක් හෝ වෙනත් ඕනෑම ඉලව්වක් සංවිධානය කර අපට ආරාධනා කිරීම පමණකි. එහිදී අවශ්‍ය නම් අපේ සංගීතය ගැන පමණක් නොව අපේ විද්‍යාව ගැනද කතා කළ හැකිය.

අනුරාධපුර සමයේ එක්තරා කාල පරිච්ඡේදයක මෙරට සිංහල ථෙරවාදි සංස්කෘතික ආධිපත්‍යයක් තිබීම අනෙක් සංස්කෘතීන් හා සම්බන්ධයෙන් ගත් කළ නිවැරදි දැයි ඇසීමට දැන් බක පණ්ඩිතයකු ඉදිරිපත්වීමට පුළුවන. ලෝකයේ කිසිම රටක කිසිම වකවානුවක යම්කිසි සංස්කෘතික ආධිපත්‍යයක් නොතිබී නැත. රට ලෙස නොව ප්‍රදේශ වශයෙන් මිනිසුන් ජනවර්ග ලෙස සැකසී සිටි වකවානුවල ද යම්කිසි සංස්කෘතික ආධිපත්‍යයක් තිබී ඇත. යම් වකවානුවක එසේ නොතිබිණි නම් එයට හේතුව එවැනි වකවානුවක සංස්කෘතීන් දෙකක් හෝ වැඩි ගණනක් අතර ආධිපත්‍යය සඳහා තරගයක් තිබීමය. එවැනි තරගයකින් පසු ජයගන්නා සංස්කෘතිය අනිවාර්යයෙන්ම තම ආධිපත්‍යය පිහිටුවයි. මේ තරගය සමහර විට යුද්ධයක් විය හැකියි. සංස්කෘතික ආධිපත්‍යය බොහෝ විට දේශපාලන ආධිපත්‍යයද සමග අත්වැල් බැඳ ගන්නා බව අමතක නොකළ යුතුය.

මෙරට සිංහල ථෙරවාද බුද්ධාගමේ ආධිපත්‍යය පිහිටුවීමේ කතාව විස්තරාත්මකව කීමට මේ අවස්ථාව නොවේ. එහෙත් එහිදී කිවයුතු වැදගත් කරුණක් වෙයි. ඇතැමුන්ට අනුව සිංහල බුද්ධාගම යනුවෙන් දෙයක් නැත. ඔවුන් කියන්නේ සිංහලයන් බුද්ධාගම විකෘති නොකළ බවත් එබැවින් සිංහල බුද්ධාගමක් ගැන කතා කිරීම වැරදි බවත්ය. බුදුන් වහන්සේ දෙසූ දහම ඒ සැටියෙන් ම අද කිසිම රටක තිබෙ යැයි මම විශ්වාස නොකරමි. අපට කිව හැක්කේ ලංකාවේ ඇති ථෙරවාදය, මහායානයට හෝ තන්ත්‍රයානයට හෝ සෙන් දහමට හෝ වෙනත් එවැනි දහමකට වඩා මුල් බුදු සමයට කිට්ටු බවය. බුදුන් වහන්සේ දෙසූ දහම ප්‍රවාද රහිතය. එහෙත් සිංහල ථෙරවාදයෙහි ද ප්‍රවාද වෙයි. අපට බුදු දහම නිල වශයෙන් ලැබුණේ තුන්වැනි සංගායනාවෙන්ද පසුවය. දෙවැනි සංගායනාව වන අවස්ථාවේදීද බුදු දහම යම් විනාශයකට හසු වී හමාරය. සංගායනා පැවැත්වුයේම බුදු දහම එලෙස විනාශ වී තිබීම නිසාය. අවුරුදු දෙදහස් තුන්සීයකට පෙර බුදු දහම මෙරට පැල පදියම් වුයේ, ඉන් සියවස් ගණනකට පසු ක්‍රිස්තියානි දහම හා සංස්කෘතීන් මෙරටට පැමිණි ආක්‍රමණ ආකාරයට නොවේ. මිහිඳු හිමියන් අපට දායාද කළ බුදු දහම මෙරට සංස්කෘතිය තුළට

© Prof. Nalin De Silva

අවශෝෂණය කර ගනු ලැබිණි. ඒ හරහා මෙරට සිංහල ථෙරවාද බුද්ධ දහමක් හා සංස්කෘතියක් ඇති විය. බුද්ධ දහම විසින් මෙරට එතෙක් පැවැති සංස්කෘතිය විස්ථාපනය නොකෙරිණි.

එහි ප්‍රතිඵලයක් වූයේ තරගයක් නොමැතිවම සිංහල ථෙරවාද බුද්ධදහම පදනම් කරගත් සංස්කෘතිය මෙරට ආධිපතිවාදී සංස්කෘතිය බවට පත්වීමය. යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් යම් පිරිසක් සියවස් ගණනක් පුරා නව සංස්කෘතිය ප්‍රතික්ෂේප කර ඇති බව පිළිගත යුතුව ඇති නමුත් එය සිංහල ථෙරවාදය බෞද්ධ සංස්කෘතියට විශාල අභියෝගයක් බවට පත්වී නැත. පණ්ඩුකාභය රජු දවස පිහිටුවන ලද සිංහල ජාතියෙහි සංස්කෘතිය වෛදිකයන් (ආර්යයන්) මෙරටට පැමිණීමට පෙර තිබු ප්‍රාග් වෛදික සංස්කෘතීන්හි හා වෛදික සංස්කෘතියෙහි මිශ්‍රණයක් වූ බව සිතා ගැනීම අපහසු නොවේ. එසේ වුවත් එහි වෛදික බලපෑම අඩු බව පණ්ඩුකාභය කුමරු (හා පසුව රජු) වටා ඇති කතාවලින් හෙළි වෙයි. මුල් බුද්ධ සමයද පදනම් වී ඇත්තේ ප්‍රාග් වෛදික සංස්කෘතියකය. එහෙත් භාරතයෙහිදී පසු කාලීන විකාශය තුළ බුද්ධ සමයට යම් යම් වෛදික ලක්ෂණද එකතු වී ඇත. වෛදික ලක්ෂණ අඩුවෙන්ම එකතු වී ඇත්තේ ථෙරවාදයට යැයි අපට නිගමනය කළ හැකිය. මහායානය වූ කලී බොහෝ වෛදික ලක්ෂණ වැඩිපුර එකතු වීමේ ප්‍රතිඵලයක් ලෙස ආත්මවාදී වූ බුද්ධ දහමකි. එයට වෛදික බුද්ධදහම යැයි කීමේ වරදක් නැත.

ප්‍රාග් වෛදික ලක්ෂණය බහුල වූ ථෙරවාදය ප්‍රාග් වෛදික ලක්ෂණ බහුල වූ සිංහල සංස්කෘතිය සමඟ රන් රස සේ මිශ්‍ර විය. ඒ මිශ්‍රණයෙන් ඇති වූයේ සිංහල ථෙරවාද බුද්ධ දහම හා අනුරූප සංස්කෘතියයි. තරගයක් නොමැතිවම අවශෝෂණ ක්‍රියාවලියක් හරහා සිංහල ථෙරවාද සංස්කෘතිය මෙරට අධිපති සංස්කෘතිය බවට පත් විය. අටවැනි හෙන්රි රජුගෙන් පසුව එංගලන්තයේ ආධිපත්‍යයට පැමිණියේ ඇංග්ලෝ සැක්සන් ක්‍රිස්තියානි සංස්කෘතියයි. අද එය ලෝකයේම අධිපතිවාදී සංස්කෘතිය බවට පත් වී ඇත. ආක්‍රමණකාරී ලෙස ලෝකයේම ආධිපත්‍යය බවට පත්වූ ඇංග්ලෝ සැක්සන් ක්‍රිස්තියානි සංස්කෘතිය අද මෙරට ද අධිපතිවාදී සංස්කෘතිය බවට පත්වී ඇත. මෙරට සිටින ඊනියා ප්‍රබුද්ධයන්ට මේ ඇංග්ලෝ සැක්සන් ආධිපත්‍යය ප්‍රශ්නයක් නොවේ. (ඊනියා පශ්චාත්නූතනවාදී ඇංකරයන් මෙය විසංයෝජනය නොකිරීම පිළිබඳව ලබන බදාදා විද්‍යුසර කියවන්න) ඔවුන්ට අදත් ප්‍රශ්නයක් වී ඇත්තේ මේ වන විට බල රහිත බවට පත්කර ඇති සිංහල බෞද්ධ සංස්කෘතියයි.

සිංහල ථෙරවාදි බෞද්ධ සංස්කෘතිය බල රහිත බවට පත් කෙරුණේ කෙසේද යන ප්‍රශ්නය සාකච්ඡා නොකර අපට බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයෙන් මෙන්ම ඒ හා අත්වැල් බැඳගත් දේශපාලන ආධිපත්‍යයෙන්ද නිදහස් විය නොහැකිය. අද අප කෙතරම් නිවටයන් බවට පත් කර ඇත්ද යන්න පෘතුගීසීන් මෙරට ආක්‍රමණය කර අවුරුදු පන්සිය සැමරීමට කරන උත්සාහයෙන් පෙනෙයි. අපේ වහල් බවේ ආරම්භයෙහි බිහිවූ දොන් ජුවන් ධර්මපාල වැනිම තවත් ජොන් ජුවන් කෙනෙකු බිහිවී ඇති මෙකල ඒ දෙවැනි දොන් ජුවන්ට පළමු දොන් ජුවන් සැමරීම භාර කෙරී ඇත. රනිල් වික්‍රමසිංහ මහතා පෘතුගීසීන් පැමිණීම සැමරීම සඳහා සාකච්ඡා කිරීමට පෘතුගාලයට යෑමට සැරසෙයි. බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය විසින් කෙරී ඇති හානිය කෙතරම් දැයි මෙයින්ම පැහැදිළි වෙයි. කැලණි විහාරය ඇතුළු බෞද්ධ සිද්ධස්ථාන පමණක් නොව යාපනයේ හින්දු කෝවිල ද පෘතුගීසීන් විසින් කඩා දමනු ලැබිණි.

මේ හින්දු කෝවිල් හා යාපනයේ දෙමළ සංස්කෘතිය ගැනද වචනයක් කිව යුතුය. පෘතුගීසීන් කඩා බිඳ දැමූ බොහෝ හින්දු කෝවිල් දහතුන්වැනි සියවස හා දහසය වැනි සියවස අතර ආර්ය චක්‍රවර්තී රජවරුන් ඉදිකළ ඒවාය. ඒ අතර නල්ලූර් කෝවිල වැනි කෝවිල් පිළිබඳ ගෞරවය හිමි වන්නේ සපුමල් කුමරුටය. සපුමල් කුමරුගේ කේරළ සම්භවය ගැන පණ්ඩිතයකු කියනු ඇත. ඔහු යාපනයට ගියේ වීරයකු ලෙස නොව සිංහල සංස්කෘතිය වැළඳ ගත් සිංහලයකු ලෙසය. යාපනයේ සංකිලි රජු බොහෝ විට සිංහල රජුගෙන් ආධාර සහිතව පෘතුගීසීන්ට විරුද්ධව යුද්ධ කෙළේය. ප්‍රභාකරන් යනු තවත් සංකිලි කෙනකු නොවේ. ප්‍රභාකරන් බටහිර ක්‍රිස්තියානි දේශපාලනය හා සංස්කෘතික ආධිපත්‍යයෙහි ඉත්තෙක් පමණකි. ඔහු බටහිරයන්ගේ ආධාර ඇතිව සිංහලත්වයට එරෙහිව කටයුතු කරයි. සංකිලි හා ප්‍රභාකරන් අතර ඇති මේ මූලික වෙනස ගැනවත් අවබෝධයක් බක පණ්ඩිතයන්ට නැත. ප්‍රභාකරන් ඇතුළු යාපනයේ වත්මන් දෙමළ ජනයාගෙන් විශාල බහුතරයක් ලන්දේසීන් විසින් දුම්කොළ වගාව සඳහා දහඅත්වැනි සියවසට පසුව දකුණු ඉන්දියාවෙන් ගෙන්වනු ලැබූවන්ගෙන් පැවතී එන්නෝ වෙති. වත්මන් දෙමළ සංස්කෘතිය හා පෘතුගීසීන් පැමිණීමට පෙර යාපන සංස්කෘතිය අතර අඛණ්ඩ සම්බන්ධයක් නැත. යාපනයේ පෘතුගීසීන් පැමිණීමට පෙර ජනගහනය මාඝ සමඟ ගමන පැමිණි කේරළ හේවායන්ගෙන් පැවතී එන්නන්ගෙන් හා සිංහලයන්ගෙන් සමන්විත විය.

© Prof. Nalin De Silva

ලන්දේසින්ගෙන් පසුව මේ අයගෙන් පැවත ආ පිරිස දුම්කොළ වගාවට ගෙන්වන ලද දෙමළ ජනවර්ගයට අවශෝෂණය කර ගනු ලැබිණි.

කැලණි රජ මහා විහාරයේ ප්‍රධාන දායකයකු ලෙස පෙනී සිටින රනිල් වික්‍රමසිංහ මහතා පෘතුගාලයට යන්නේ කැලණි විහාරය කඩා බිඳ දැමූවන්ට මෛත්‍රිය පැතිරවීමට විය යුතුය. ඒ මහතාට ඒ සඳහා කැලණි විහාරයේ විහාරාධිපති හිමියන්ගේ ආශිර්වාදයද ලැබෙන්නේ දැයි අපි නොදනිමු. අද බටහිර ක්‍රිස්තියානි ආධිපත්‍යය විසින් බෞද්ධයන්ට මෛත්‍රි කිරීමේ වැදගත්කම කියා දෙනු ලැබේ. මෙරට යුද්ධයට විරුද්ධව ඊනියා සාමය වෙනුවෙන් කටයුතු කරන සංවිධාන බොහෝමයක් ක්‍රිස්තියානි සංවිධාන වන අතර, අනෙක් එවැනි සංවිධානවලටද, බටහිර ලූතරවාදී නෝර්වේ ඇතුළු ස්කැන්ඩිනේවියානු රටවලින් මෙන්ම බ්‍රිතානි පොදු රාජ්‍ය මණ්ඩලයේ ඇංග්ලිකන් ක්‍රිස්තියානි සුදු රටවලින් හා ක්‍රිස්තියානි ඇමරිකාවෙන් ආධාර ලැබෙයි. අද මෙරට සුද්දන් විසින් ඇති කරන ලදුව, අපද විශ්වවිද්‍යාල හා පාසල් හරහා පවත්වාගෙන යන සහ දේශද්‍රෝහී අධ්‍යාපනය මගින් අපට කියා දෙනු ලබන්නේ දුටු ගැමුණු රජු එළාරට මෛත්‍රී කළ යුතුව තිබූ බවය. දුටු ගැමුණු රජු ලෝකයේ පැවති එකම එක යුද්ධය කළ තැනැත්තා වැනි හැඟීමක් මුළු මහත් ලෝකයේ විනාශ කළ බටහිර අධිපතිවාදී සංස්කෘතිය මගින් අපට දෙනු ලැබෙයි. පෘතුගීසීන් විසින් පටන් ගන්නා ලද බටහිර ක්‍රිස්තියානි දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ආධිපත්‍යයෙන් මුළුමනින්ම නිදහස් වීම සඳහා පියවර ගැනීම පෘතුගීසී වින්නැහිය ආරම්භ වී අවුරුදු පන්සීය පිරීම වෙනුවෙන් අප කළ යුතු දෙයයි.

බටහිරයන් සිංහල ථෙරවාදි බෞද්ධ සංස්කෘතියේ ආධිපත්‍යය බිඳ දැමීමට යොදා ගන්නා ලද ප්‍රධානම අවිය වූයේ බටහිර ක්‍රිස්තියානි අධ්‍යාපනයයි. පාණදුරාවාදයට බිඳ දැමීමට නොහැකි වූවේද මේ අධ්‍යාපනයයි. ඒ නිසාම පාණදුරාවාදය විසින් සිංහල බෞද්ධයන්ට අත්කර දෙන ලද ජයග්‍රහණ වැඩිකල් යන්නට මත්තෙන්ම නැති විණි. අවාසනාවකට පාණදුරාවාදයද ඕල්කට්තුමා හරහා ඒ ජයග්‍රහණ නැති කිරීමට ඉවහල් විණි යැයි කිව හැකිය. මේ කරුණ වාක්‍යයකින් කියා නිම කළ හැක්කක් නොවේ. සිංහල ථෙරවාද බෞද්ධ සංස්කෘතික ආධිපත්‍යය බිඳ දැමීමේ කතාවෙහි පාණදුරාවාදයට පරිච්ඡේද කිහිපයක්ම වෙන් විය යුතුය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva